## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
## ලංකා පොස්පේට් ලිමිටඩ්

# පුරප්පාඩු

**අයදුම්පත් කැඳවීම**

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන ලංකා පොස්පේට් ලිමිටඩ්හි දැනට පුරප්පාඩුව පවතින රියදුරු තනතුර සඳහා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට හැකියාව ඇති දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් හෙබි ශ්‍රී ලාංකිය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

"ප්‍රාථමික - ශිල්පිය " සේවා ගණයේ **(PL – 3)** රියදුරු තනතුර - ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව - 03

සුදුසුකම් :- **බාහිර අයදුම්කරුවන්:-**

**අධ්‍යාපන -**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හයකින් (06) සමත්වීම

**ප්‍රවීණතා-**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පලපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් -

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ(05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

වැටුප් ක්‍රමය :- **PL 3 - 2025 - රු. (43,280 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - 67,040)**

වැටුප් පියවර :- **40834/-** (2025.03.25 **දිනැති** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

බඳවා ගැනීමේ වයස :- වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

සේවා ස්ථානය :- ලංකා පොස්පේට් ලිමිටඩ්, එප්පාවල කාර්යාලය

වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා

- රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව
- මාසික නිෂ්පාදන දිරි දීමනා
- පැමිණීමේ දීමනා
- ප්‍රවාහන දීමනා
- ආහාර දීමනා

වෙනත් ප්‍රතිලාභ

- වාර්ෂික ප්‍රසාද දීමනා
- ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
- සේ.අ.අ./ සේ.භා.අ. දායකත්වය
- වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් බිල්පත් ප්‍රතිපූර්ණය
- පුද්ගල හදිසි අණතුරු රක්ෂනාවරණය

බඳවාගැනීමේ ක්‍රමය :-

අයදුම්පත් කැඳවීමෙන් පසුව තෝරාගත් අයදුම්කරුවන්ගෙන් තනතුරට අදාල වන පරිදි වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක සහ ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, අයදුම්පත් සම්පූර්ණ ජීවදත්ත ඇතුලත්ව උප්පැන්න සහතිකයේ පිටපතක් අදාල අධ්‍යාපනික සහ වෙනත් අදාල වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත්ද සහිතව අදාල ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා දැනුම පිළිබඳ තක්සේරු කල හැකි ඥාතින් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග නිසි පරිදි සම්පූර්ණ කර ලේඛනගත (ලියාපදිංචි) තැපැලෙන් 2026 ජුලි මස 30 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් අප වෙත ලැබීමට සැලැස්විය යුතුය.

මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන පරිදි ඉදිරිපත් කරනු ලබන සියළුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන ලිපිකවරයේ වම්සප ඉහල කෙලවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කල යුතුය.

සේවා පලපුරුද්ද හා ලබා ඇති සුදුසුකම් පදනම් කරගනිමින් තෝරා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

සභාපති
ලංකා පොස්පේට් ලිමිටඩ්,
එප්පාවල
දුරකථන අංකය- 025-2249121
2026.07.13 දින,